# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

# ඇබෑර්තු

# අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු

අපනයන ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) එහි ඉහළ කළමනාකාරීත්ව කණ්ඩායමට එක්වීම සඳහා බලෝත්පාදක ස්වයං අභිප්‍රේරණය වූ සුවිශේෂී නායකත්ව හැකියාවන්ගෙන් යුත් වෘත්තිකයන්ට ආරාධනය කරනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන්ට අපනයන සංවර්ධන මණ්ඩලයේ වෘත්තීය හා සේවයට කැප වූ කණ්ඩායමක් සමඟ වැඩ කිරීමට සහ ජාත්‍යන්තර වෙළඳාම තුළින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා දායකත්වය සැපයීම සඳහා සමීපව සම්බන්ධ වීමට අවස්ථාව සැලසේ.

## 01. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) HM 2-1

### රැකියා විස්තරය

ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක විසින් පවරනු ලබන සංවර්ධන, මෙහෙයුම් සහ තාක්ෂණික කටයුතුවලට අදාළ රාජකාරි / කාර්යයන් / බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ අලෙවි සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම.

**සුදුසුකම් : (පහත සඳහන් 1 හෝ II හෝ III)**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයක තනතුරට අදාළ විෂය පථය ආශ්‍රිත සාමාජිකත්වය සමඟ

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර එයින් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

II. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් ගණකාධිකරණ ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළවක (15) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර පහක (05) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

## 02. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන) HM 2-1

### රැකියා විස්තරය

ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක විසින් පවරනු ලබන පරිපාලන සහ මූල්‍යමය කටයුතුවලට අදාළ බලතල / කාර්යයන් / රාජකාරි ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ ආයතනයේ සියලුම අංශ / ඒකකවලට පරිපාලන සහ මූල්‍යමය කටයුතු සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම.

**සුදුසුකම් : (පහත සඳහන් 1 හෝ II හෝ III)**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / වාණිජ / කලා / ඉංජිනේරු / ගිණුම්කරණය / මානව සම්පත් කළමනාකරණය / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයක තනතුරට අදාළ විෂය පථය ආශ්‍රිත සාමාජිකත්වය සමඟ

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එයින් වසර පහක් (05) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

II. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් ගණකාධිකරණ ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළවක (15) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර පහක (05) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

**වයස් සීමාව :**

අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය. කෙසේ වුවද මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :**

රු. 91,645/- 12 x 2700 = 124,045/- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) අංක 2 / 2016 දරන චක්‍රලේඛයේ ඇමුණුම II හි සඳහන් උපදෙස්වලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

රජයේ රෙගුලාසිවලට අනුකූලව රාජකාරි සහ සීමිත පුද්ගලික පාවිච්චිය සඳහා අනුයුක්ත කරන ලද වාහනයක් සපයනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය**

විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් ප්‍රතිලාභ**

- ❖ පවුලේ සාමාජිකයන්ද ආවරණය වන පරිදි වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීම
- ❖ රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ ආපදා ණය
- ❖ රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය
- ❖ වාර්ෂික ප්‍රසාද දීමනා සහ ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය
- ❖ සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15%
- ❖ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙල**

මෙම තනතුර ශ්‍රී ලාංකික පුරවැසියන්ට විවෘත වේ. අදාළ අයදුම්පත්‍රය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබාගත හැක. සම්පූර්ණ ජීව දත්ත සඳහන් අයදුම්පත් අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් සමඟ 2017.02.02 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට සභාපතිනිය සහ ප්‍රධාන විධායක වෙතට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුයි.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර මණ්ඩලය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**සභාපති සහ ප්‍රධාන විධායක**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

NDB-EDB **කුලුන, අංක 42, නවම් මාවත, කොළඹ 02.**

**දුරකථන : 0112300700, ෆැක්ස් : 0112300715**

**www.srilankabusiness.com**